ලාංකිකයන්ට වුව ද ඔවුන් අපේක්ෂා කරන 'හොඳ හිත' කොතරම් නම් එහිදී හමුවෙයිද? වසන්ත කුමාර මෙහිදී "බෝ හිඟය කියා හිතුණා. දුරු රටක වුවද නිතිනා" යන්නෙන් විශේෂයෙන්ම අදහස් කරන්නට ඇත්තේ තම රටේ යන්තමින් හෝ තවමත් ඉතිරිව ඇති 'හොඳ හිත' දුරු රටක එතරම් වත් නැති බවක්, හිඟ බවක් විය හැකිය. ඒ අනුව ලොව කවර රටක, කවර තැනක ජීවත් වුවත්, ශ්‍රී ලාංකික සමාජයට ආවේණික සාරධර්ම, යහගුණ, සුහද ගෑරුගෝල සබඳතා යනාදිය විදෙස්වල ජීවත් වන එම ශ්‍රී ලාංකිකයන්ට අත් විඳින්නට නොමැති බවක් මෙයින් ගම්‍ය වෙයි.

ප්‍රවීණ ගීත රචකයකු සතුව තිබිය යුතු භාෂා ප්‍රාගුණ්‍යය මෙන්ම උචිත ලෙස පද ගළපාගැනීම ද වසන්ත කුමාර වෙත ඇති බව ඔහු නිර්මාණය කර ඇති අනෙක් බොහෝ ගීත රචනාවලින් ද මැනවින් ප්‍රකටය. "මිතු ඇසුර හුයෙන් බැඳෙනා - ගුරු සුවඳ නොහිමි හමනා" යනුවෙන් මෙහිදී පද ගළපාගෙන ඇති ආකාරය ද බෙහෙවින් රමණීය බව පෙනේ. "ගුරු සුවඳ" යනුවෙන් කර ඇති පද ගැළපීමේදී එම සම්බන්ධතාව කොතරම් ප්‍රබල, දයාබර, සෙනෙහෙබර, සුහද එකක්ද යන්න රසික සිත් තුළට නැග එන්නේ නිරායාසයෙනි. මව් ගුණ ගැන සිහි කරන විට "කිරි සුවඳ", "මව් ගුණ සුවඳ" වැනි යෙදුම් භාවිත කරන්නේ ද අතිශය ගැඹුරු සෙනෙහෙබර සිතුවිලි ප්‍රකර කරවන්නටය. ඒ අනුව "ගුරු සුවඳ නොහිමි හමනා" යන පද යෝජනයෙන් ශිෂ්‍යයකුගේ සිත් තුළ කිඳා බැස ඇති අසීමිත ගුරු භක්තිය මැනවින් ප්‍රකාශිතය.

ගුරුතුමා, ශිෂ්‍යයා බැහැ දකින්නට එන්නේ වෙන කිසිවක් රැගෙන නොව දරුවකුට මෙන් තමන් තුළ හටගත් දැඩි ආදරය මුසු වූ හොඳහිතම තෑගිබෝග ලෙස රැගෙනය. සතුටු සිතින් එය පිළිගන්නට සැරසෙන ශිෂ්‍යයාගේ ප්‍රතිචාර ද ඊට අනුකූල වන පරිද්දෙන් ගළපා තිබීමෙන් මෙම ගීතයෙහි සුන්දර බව මෙන්ම අර්ථාන්විත බව ද දෙගුණ තෙගුණ වෙයි. යහගුණ දන්නා එමෙන්ම යන එන තැන යහගුණ පතුරුවන තම ආදරණීය ගුරු පියාණන් ගැවසෙන, යන එන සියලු-තැනකම එම යහගුණය පිරී දිලෙන අයුරු ගීතයෙන් ඇසෙන විට රසික සිත් සතන් ඉමිහිරි සිතුවිලි සමුදායකින් සන්තර්පණය කරවයි.

විශ්වසමාජය වාණිජත්වය කරා යොමු වෙද්දී මිනිස් සිත් තුළ පෙර පැවති සිසිලස පහව යමින් ඒ සොඳුරු බව වෙනුවට මතු වී එන්නේ 'සඳ පාන වුවත් ගිනි ගැනෙන තරම්' අහිතකර තත්වයකි. එසේ වුවද යහපත් සිතුවිලි සිත දරාගෙන, 'මෙත් අරුණ මැදින්' උතුම් ගමනක යෙදෙන්නට කවුරුන් හට හෝ අවශ්‍ය වෙතොත් ඊට ද අවකාශ නැත්තේ නොවේ. සියල්ලටම සිත මුල් වන හෙයින්ම මෙත් සිතින් යුතුව කරන කියන දෑ මගින් තව දුරටත් යහගුණ පතුරු-වන්නට නොහැකි නොවන්නේය.

ගී පද රචකයා මෙම පදමාලාව මගින් මතු කර දක්වන සුන්දර ගී සංකල්පනාව රසික හදවත් තුළ සැබෑ සංවේදී සිතුවිලි ජනිත කරවීමට සමත් වෙයි. ලොවක් අරගල, දුක් කම්කටොලුවලින් ගිනි ගෙන දැවෙද්දී වුව යහපත් සිතුවිලි රැගත් චිත්ත සන්තානයකින් නිබඳවම මෙත් සිත් පතුරුවා ලිය හැකි වනු ඇත යන සාධනීය හැඟීම මෙම ගීතයෙන් ධ්වනිත වෙයි. ලෝක ස්වභාවය අප දෑස් ඉදිරියේ මතු වී පෙනෙන්නේ ගීත රචකයා දක්වන පරිදි "මල් යාය වුවත් මිලින වන" අයුරුත් නිල් දිය දහමින් යුත් ගඟ දිය වුවද සිඳී යා හැකි අයුරුත් සිහිපත් කරවමිනි. ශ්‍රී ලාංකික සිංහල සංස්කෘතිය උරුම කරගත් සහෘදයිනට හුරු පුරුදු සුන්දර සිතුවිලි ගෙනෙන රමණීය යෙදුම් ලෙස "පුර පෝය ලෙසින්" "හඳ එළිය කරන්" යනාදී සංකල්පනා දැක්විය හැකිය.

සැබෑ ගුරුවරයා වූ කලී තමන් උගන්වන කවර විෂයකින් වුව තම සිසු දරුවනට පැහැදිලි මනසකින් යුතුව ලොව දකින්නට උපකාර වන්නෙකි. රෝහණ කරුණාරත්න ගායකයාගේ මුවින්, "ඔබ සොයමි නිතින් - නව අරුණ මැදින් පුර පෝය ලෙසින් -. මට සොයුරු රැකුම් හඳ එළිය කරන් - ලොව දකිමි තුටින්" යනුවෙන් ගැයෙද්දී ඉහත දැක්වූ සුන්දර ගුරුගෝල සම්බන්ධතාව පමණක් නොව යහපත් සිතකින් කළ හැකි මහඟු දේ අනන්ත අප්‍රමාණ වන බව ද අපට අවබෝධ වෙයි. ගීත රචකයකු වෙත තිබිය යුතු පුළුල් භාෂා ඥානය මෙන්ම ඖචිත්‍යයෙන් යුතුව, අර්ථ පූර්ණය වන පරිදි පද ගැළපීමේ ශක්තිය ද ප්‍රදර්ශනය කරන වසන්ත කුමාර කොබවක මෙන්ම එම ගීතයේ අරුතට සැබෑ සාධාරණත්වයක් ඉටු කර ඇති වික්ටර් රත්නායක නම් වූ විශිෂ්ට කලාකරුවාත්, එතුමාගේ සංගීත ඥානාලෝකයෙන් බැබළෙන්නට වරම් ලද රෝහණ කරුණාරත්න ගායකයාත් මෙම ගීතය ශ්‍රවණය කරන රසිකයාගේ සිත් තුළ සනිටුහන් වනු ඇතැයි මම සිතමි. සියලු දේට සිත මුල් වන අයුරින්ම, මෙවන් යහපත් සිතුවිලි හා කර්තව්‍යයන් ද යහපත් සිත් මුල් කොටගෙන ප්‍රකාශිත බව ද පෙනේ.


# බෙරික් ශාක්‍යමුනි සම්බුද්ධ විහාරයේ සම්බුදු තෙමඟුල් වෙසක් වැඩ සටහන



**2014** මැයි මස **10** සෙනසුරාදා පෙ.ව. **8.00** සිට ප.ව. **5.00** දක්වා සිදු කෙරෙන සීල සමාදාන වැඩ සටහනින් ආරම්භ වේ.

මැයි මස **10, 11, 17, 18** යන දිනවල ප.ව. **6.00** සිට

- වෙස්සන්තර ජාතකය ඇසුරෙන් වංකගිරිය
- තිලමුට්ඨි ජාතකය නිරූපණය කෙරෙන කැරකෙන වෙසක් පහන් කූඩුව හා වෙසක් සැරසිලි
- බොදු බැති ගී සරණිය

ආදී විශේෂාංග ද ඔබට දැක බලා ගත හැකිය.

මෙවර තරුණ සීල සමාදාන වැඩ සටහන ද මැයි **11** ඉරිදා පෙ.ව. **9.00** සිට ප.ව.**2.00** දක්වා සිදු කෙරේ. ඉංග්‍රීසි බසින් සිදු කෙරෙන මෙම වැඩ සටහනට ඔබේ දරුවන් සහභාගී කරවන්න.

මෙම වැඩ සටහන් සිදු කෙරෙන සෑම දිනක ම විහාර අරමුදලට ආධාර පිණිස ආප්ප හලක් ද පැවැත්වේ .



මෙම වැඩ සටහන්වලට පැමිණ සහභාගී වීමෙන් හා නැරඹීමෙන් කුසල් සිත් පහළ කර ගන්නා ලෙස ශාසනාලයෙන් යුතුව ආරාධනා කරමු.

125,Homestead Rd,
Berwick, Vic 3806
( Mel Ref 130 J2 )
03 9702 6275



*Celebrating*

2003 10 Years 2013

AUSTRALIA GATEWAY
*Australian Immigration Law Advisory*

**THE LEADING AUSTRALIAN MIGRATION LEGAL ADVISORY FIRM IN SRI LANKA**

***"You have kept trust on us because we delivered results in simple Immigration matters to most complicated Immigration legal matters. In Australia we have won appeals and still winning. It is the spirit of our team. Our team of lawyers and consultants are either qualified in Australia or Sri Lanka and we are committed with absolute confidence, honesty to deliver results to you"***



**Susantha Katugampala** - LL B (Monash) Barrister & Solicitor in Australia
Chairman
Fairfields Lawyers Australia
Australia Gateway Sri Lanka

Accredited Immigration Law Specialist

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE
10 Morrison Place East Melbourne Victoria 3002 Australia
T : +61 3 9650 4557 F : +61 3 9650 4559 M : +61 417 851 041
info@fairfieldslawyers.com

AUSTRALIA GATEWAY
No. 602 Level 6 Jaic Hilton Towers, Colombo 2 Sri Lanka
T : +94 112 300627 M : +94 777 347670 M : +94 717 347670
admin@australiagateway.com

***We Deliver Results...***